# අමද්‍යප ව්‍යාපාරය හා බැඳුණු සිංහල සාහිත්‍යය
# බෞද්ධ - ක්‍රිස්තියානි අන්තර් ආගමික සහයෝගී සාහිත්‍යයක ආදර්ශයක්

බුද්ධික කෝනාර[1]

ක්‍රි. ව. 1904 දී හා 1912 දී සක්‍රීය ලෙස කරළියට පැමිණි අමද්‍යප නැගිටීම් දෙක පාදක කරගෙන මෙරට සුවිශේෂීගද්‍ය හා පද්‍ය සාහිත්‍යයක් බිහි විය.මේ සාහිත්‍යයේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ අන්තර් ආගමික සහයෝගීතාවයි.විශේෂයෙන් බෞද්ධ හා ක්‍රිස්තියානි පිරිස් අතර දක්නට ලැබුණ මේ ආගමික සහයෝගීතාව ඊට දශක කිහිපයකට ඉහත දී නම් කිසිසේත් ම අපේක්ෂා කළ නොහැක්කක් විය. 1891 වර්ෂයේ දී පළ කෙරුණ 'අමද්‍යපාන වාක්‍ය සංග්‍රහය' නම් කෘතිය ක්‍රිස්තියානි ප්‍රකාශනයක් වුවත්එහි ගද්‍යමය දෙබස් අනුසාරයෙන් බෞද්ධ ඉගැන්වීම් සිහිපත් කර දෙන ලදි.1892 වර්ෂයේ දී පළ වූ 'සුරාසොඬ සන්දේශයේ' කතුවරයා චාල්ස් විලියම් ද සිල්වා නම් පූජකතුමෙකි. 1893 දී 'මද්‍ය විභාගය' කෘතිය කළ ප්‍රකට බෞද්ධ උගතෙකු වූ එම්. ධර්මරතන පඬිතුමා ස්වකීය කෘතියට ක්‍රිස්තියානි ඉගැන්වීම් ද උපටාගත්තේ ය.1904 දී සී.පී.ඩී සෙනෙවිරත්න නම් කවියෙකු විසින් රචනා කරන ලදුව කොළඹ ලක්සිළුමිණ යන්ත්‍රාලය නම් බෞද්ධ මුද්‍රණාලයේ මුද්‍රණය කෙරුණ 'සුරා සංහාරය හෙවත් සුරායක්ෂයා විනාශ කරලීම' නම් පද්‍ය කෘතියට ක්‍රිස්තියානි ප්‍රකාශනයක් වූ 'අමද්‍යපාන වාක්‍ය සංග්‍රහයෙන්'ද පද්‍ය උපුටා ගත්තේ ය. එම වර්ෂයේ දී ම බෞද්ධයෙකු වූ ඩබ්. ඒ. ද සිල්වා විසින් තවත් බෞද්ධ මුද්‍රණාලයක් වූ විද්‍යා සාගර යන්ත්‍රාලයේ මුද්‍රණය කරන ලද 'සුරා මුගුර' නම් කවි පොතට ක්‍රිස්තියානි කවියෙකු කළඉහත කී 'සුරාසොඬ සන්දේශයේ' පද්‍ය ද උද්ධෘත කෙරිණ. 1912 දී රචිත 'මත්පැන්' නම් ගද්‍ය කෘතිය රචනා කළේ චාර්ල්ස් එඩ්වඩ් සිල්වා නම් පූජකතුමෙකි.එම ග්‍රන්ථයේමුල් පිටුවේ ඇත්තේ මත්පැනෙහි විපාක පවසන පාලි ගාථාවකි. ග. සීලානන්ද හිමියන් විසින් රචිත 'සුරා පානයේ වරද පෙන්වීම' (1916) නම් කෘතියේ ක්‍රිස්තියානි ආගමික ඉගැන්වීම්වලට පමණක් නොව මහමත් ආගමික ඉගැන්වීම්වලටත් ඉඩක් වෙන් කෙරිණ. මේ අනුව බලන විට බෞද්ධ ක්‍රිස්තියානි දෙපිරිස් අතර මුහුණට මුහුණ වාද, පොත් පත් හා පුවත් පත් සඟරා වාද විවාද සුලබ වූ ඒ යුගයේ අපේක්ෂා කළ නොහැකි අන්දමේ ආගමික සහජීවනයක් අමද්‍යප සාහිත්‍ය කෘතිවලින් පෙනේ. සමාජයට හිතකර පොදු අරමුණක් වෙනුවෙන් වාද බේද දුරලා පෙරමුණට පැමිණිබෞද්ධ- ක්‍රිස්තියානි අන්තර් ආගමික සහයෝගී සාහිත්‍යයලංකා ඉතිහාසයේ විරල අවස්ථාවක් ලෙස ඓතිහාසිකව ස්ථාන ගත කිරීම මෙමම අධ්‍යයනයෙන් සිදු කෙරේ.

ප්‍රමුඛ පද: අමද්‍යප ව්‍යාපාරය, සිංහල සාහිත්‍යය, ආගමික සහයෝගීතාව, බෞද්ධ මුද්‍රණාල, ක්‍රිස්තියානි ඉගැන්වීම්

1 පශ්චාත් උපාධි අපේක්ෂක, සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
bnkonara@yahoo.com